සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

පළමු වාර ඇගයීම - 2019
முதலாம் தவணை மதிப்பீடு
First Term Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 10 | විෂයය / பாடம் / Subject | Christianity | පත්‍රය / வினாத்தாள் / Paper | II | පැය / மணித்தியாலம் / Hours | 2 |
|---|---|---|---|---|---|---|---|

**පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. ඉතිරි ප්‍රශ්න අතරින් හතරක් තෝරා පිළිතුරු ලියන්න. පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න 5 කට පිළිතුරු සැපයිය යුතු වේ.**

1. 1. ''දෙවියන් වහන්සේ අප සමඟයි'' යන අර්ථය ඇති නාමය වන්නේ කුමක්ද?
   2. ස්නානාවක ජොහාන් පිළිබඳව යෙසායා දිවැසිවරයා කළ ප්‍රකාශයේ ඇතුළත් කරුණු දෙකක් ලියන්න.
   3. මරියතුමිය තම ඥාති සොයුරිය එලිසබෙත් බැහැදැකීමට පැමිණි අවස්ථාවේ මරියතුමිය ව පිළිගනු ලැබූ ආකාරය ලියන්න.
   4. ජේසුස්වහන්සේගේ උපත පිළිබඳව එඬේරුන් ලද සළකුණ කුමක්ද?
   5. ස්නාවක ජොහාන් චාම් දිවි පෙවෙතක් ගත කළ බවට සාක්ෂි දෙකක් ඉදිරිපත් කරන්න.
   6. රෝම අධිරාජ්‍යයට යටත්ව තිබූ ප්‍රදේශ දෙකක් නම් කරන්න.
   7. ජුදෙව්වන් තම ආගමික කටයුතු සඳහා රැස්වූයේ කොතැනටද ? එහි ප්‍රධාන කාර්යය වූයේ කුමක්ද?
   8. ''ප්‍රේරිත'' යන්නෙහි අර්ථය ලියන්න.
   9. පේදුරු යන නාමයේ අර්ථය ලියන්න.
   10. ඔබ තුළ තිබිය යුතු යහපත් ගුණාංග දෙකක් ලියන්න.

2. 1. දිවැසිවරයා යනු කවුදැයි හඳුන්වන්න.
   2 දිවැසිවරයාගේ කාර්යභාරය ලියා දක්වන්න.
   3 ඔබ පාසලේ දී, නිවසේ දී, දිවැසිවර කාර්යභාරය ඉටු කිරීමට සිදුවන අවස්ථා හා ඊට දක්වන ප්‍රතිචාර ලියන්න.

3. 1. සෙකරියස්ගේ ප්‍රශංසා ගීතයෙහි අඩංගු විශේෂ කරුණු දෙකක් ලියන්න.
   2. ස්නාවක ජොහාන්ගේ පණිවිඩය ලද ජන කණ්ඩායම් තුනක් නම් කරන්න.
   3. වර්තමාන සමාජයේ දක්නට ලැබෙන අසාධාරණකම් 2 ක් සඳහන් කොට ඒවාට දෙව් වදනින් පිළිතුරු ලියා දක්වන්න.

4. 1. නාසරෙත් ප්‍රකාශයේ සඳහන් වන ජේසුස් වහන්සේගේ කරුණාවට භාජනය වන ජන කණ්ඩායම් 2 ක් නම් කරන්න.
   2. නාසරෙත් ධර්මශාලාවේ දී ජේසුස් වහන්සේ අන්‍ය ජාතීන් අගය කරමින් උදාහරණ ලෙස ඉදිරිපත් කළ දෙදෙනා නම් කරන්න.
   3. නාසරෙත් ප්‍රකාශයට අනුව කිතුනු සභාව තුළ හා සමාජය තුළ ඔබට පැවරෙන කාර්යභාරය ඉටු කරන්නේ කෙසේදැයි ලියා දක්වන්න

5. 1. තිබේරියස් විල හඳුන්වන වෙනත් නාමයන් දෙකක් ලියන්න.
   2. මුල් ශ්‍රාවකයින් කැඳවීම ලද අවස්ථාවේ පේදුරුතුමාගේ ක්‍රියාකලාපයෙන් ලද හැකි ආදර්ශ තුනක් ලියන්න.
   3. කැමැත්තෙන් ධර්මදූත සේවයට යොමු වන ඔබට පැමිණෙන අභියෝග ඉදිරියේ කෙසේ ක්‍රියා කළ යුතු දැයි ලියා දක්වන්න.

6. 1. ජේසුස් වහන්සේ ශ්‍රාවකයන් දොළොස් දෙනාට හා සැත්තෑ දෙනාට පැවරූ කාර්ය 2ක් ලියා දක්වන්න.
   2. ශ්‍රාවකයින් දොළොස් දෙනාට හා සැත්තෑ දෙනාට ලබාදුන් උපදෙස් තුනක් ලියන්න.
   3. ''වග වලසුන් මැදට යවමි'' යන වචන වලින් හෙළිවන අභියෝග හා ඉන් ජයගත හැකි ආකාරය ලියන්න

7. පහත මාතෘකා අතරින් දෙකක් පිළිබඳ කෙටි සටහන් ලියන්න
   1. ජේසුස් වහන්සේ මෙන් සැවොම පිළිගනිමු
   2. ජේසුස් වහන්සේ වෙනුවෙන් ඉටුකළ ජුදෙව් චාරිත්‍ර
   3. කිතු උපත පිළිබඳ අනාවැකි ඉටු වූ අයුරු
   4. දෙව් වදන් අනුව ජීවත් වෙමු

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

පළමු වාර ඇගයීම - 2019
முதலாம் தவணை மதிப்பீடு
First Term Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: Christianity | පත්‍රය / வினாத்தாள் / Paper: I | පැය / மணித்தியாலம் / Hours: 01 |

1 ජේසුස් වහන්සේ හැදුනු වැඩුනු නගරය  වන්නේ
1 ජෙරුසලම  2 නාසරෙත්  3 ජුදය  4 සමාරිය

2 ''රබ්බි' යනුවෙන් හැඳින්වූයේ
1 දිවැසිවරයා  2 වීරවරයා  3 ගුරුවරයා  4 පරිසිවරයා

3 නාසරෙත් ධර්මශාලාවේ දී ජේසුස් වහන්සේ කියවන්නට යෙදුන පැරණි ගිවිසුම් පාඨය වන්නේ
1 යෙසායා 61:1-2  2 ගීතාවලිය 123:1-2  3 ජෝබ් 2:1-2  4 නික්මයාම 2:1-2

4 ස්නාවක ජොහාන් තුමාගේ මවුපියන් වන්නේ
1 ආබ්‍රහම් හා සාරා  2 ජෝසෙප් සහ මරියා
3 ඊසාක් සහ රෙබෙකා  4 සෙකරියස් හා එළිසබෙත්

5 පෙරමඟ දූතයා යන නාමය හිමි වූයේ
1 ස්නාවක ජොහාන් තුමාට  2 ජේසුස් වහන්සේට  3 පාවුල්තුමාට  4 පේදුරු තුමාට

6 ගනඳුරු දේශයේ විසුවන්ට ආලෝකයක් වුයේ කවුරුන් මගින්ද
1 යේසුස් වහන්සේ මගින්  2 මෝසෙස් මගින්
3 ස්නාවක ජොහාන් මගින්  4 ආබ්‍රහම් මගින්

7 මෙසියස් වහන්සේ හෙවත් ජේසුස් වහන්සේගේ ශ්‍රේෂ්ටත්වය ප්‍රකාශ කළ දිවැසිවරයා වන්නේ
1 ජෙරමියා  2 එලියා  3 යෙසායා  4 එලිෂා

8 එතුමාණෝ ................................ ද ................................ ද රජකම් කරන සේක.
1 යුක්තියෙන් ද ධර්මිෂ්ඨකමින් ද  2 යුක්තියෙන් ද ප්‍රේමය ද
3 ධර්මිෂ්ඨකම හා දයාව  4 ප්‍රේමයෙන් ද දයාවෙන් ද

9 ආලේප ලත් තැනැත්තා යන නාමය හිමි වන්නේ
1 පාවුල්තුමාට  2 ආබ්‍රහම්තුමාට  3 මෙසියස් වහන්සේ ට  4 ස්නාවක ජොහාන් ට

10 ස්නාවක ජොහාන්ගේ සේවය පිළිබඳව ප්‍රකාශ කළ දිවැසිවරයා වන්නේ
1 එසකියෙල්  2 මලාකි  3 එලිෂා  4 ජෙරමියා

11 ජේසුස් වහන්සේ සිටි කාලයේ ජුදා සමාජයේ දුර්වලතා පෙන්වමින් අභියෝගාත්මක මෙහෙවරක් ඉටු කළේ
1 පේදුරු තුමා  2 පාවුල්තුමා  3 මෝසෙසෙස් තුමා  4 ස්නාවක ජොහාන් තුමා

12 ''දුක් විඳින සේවකයා'' ලෙස හඳුන්වනු ලබන්නේ
1 පේදුරු තුමාවය  2 පාවුල්තුමාවය  3 ජේසුස් වහන්සේවය  4 ස්නාවක ජොහාන්වය

13 ජේසුස් වහන්සේ පිළිබඳව එතියෝපීය නපුංසකයා ට ශුද්ධ ලියවිල්ල පහදා දුන්නේ
1 පේදුරුතුමා  2 පිලිප්තුමා  3 අන්ද්‍රෑතුමා  4 ජාකොබ්තුමා

14 ජේසුස් වහන්සේගේ ජීවිත පූජාව තුළින්
1 දෙවියන් වහන්සේ හා මිනිසා අතර පළුදු වූ මිබන්ධතාව නැවත ස්ථාපිත විය
2 රෝම රජයට පහරක් විය
3 යුදෙව්වන්ට සතුට ගෙන දෙන්නක් විය
4 ශ්‍රාවකයින්ගේ සියලු බලාපොරොත්තු ඉටු විය

15 ගාබ්‍රියෙල් දේව දූතයා ගෙන එනු ලැබූ සුබ පුවත වන්නේ
1 සාමුවෙල් ගේ උපත පිළිබඳව ය  2 ඒසව් හා ජාකොබ්ගේ උපත පිළිබඳව ය
3 කිතු උපත හා ස්නාවක ජොහන්ගේ උපත පිළිබඳව ය  4 දාවිත් හා සාවුල්ගේ උපත පිළිබඳව ය

16 බොහෝ දෙනා ඔහුගේ උපත නිමිත්තෙන් ප්‍රීති වන්නාහ. මෙම ප්‍රකාශය කවුරුන් පිළිබඳව කා හට කරන ලද්දක්ද.

1 සෙකරියස් ට ස්නාවක ජොහාන් පිළිබඳව
2 මරියතුමියට ජේසුස් වහන්සේ පිළිබඳව
3 ආබ්‍රහම්ට ඊසාක් පිළිබඳව
4 රෙබෙකාට ඒසව් පිළිබඳව

17 ''මක්නිසාද දෙවියන් වහන්සේට නොකළ හැකි කිසිවක් නැත'' මෙය පැවසුවේ කවුරුන් විසින් කා හට ද

1 ග්‍රාබ්‍රියෙල් දේවදූතයා විසින් එලිසබෙත්ට
2 මිඛායෙල් දේවදූතයා විසින් සාරාට
3 මිඛායෙල් දේවදූතයා විසින් රෙබෙකාට
4 ගාබ්‍රියෙල් දේවදූතයා විසින් මරියතුමියට

18 ''බලන්න මම ස්වාමින් වහන්සේගේ දාසිය වෙමි'' මරියතුමියගේ මෙම වදනින් ඉස්මතුවන විශේෂ ගුණාංග ය වන්නේ

1 නිහතමානී කම
2 බලය විදහා පෑම
3 දුර්වල බව පිළිගැනීම
4 තමා දාසියක් බව පිළිගැනීම

19 මරියතුමිය දේව කැමැත්තට අවනත වීම තුලින් පිළිබිඹු වන්නේ
1 ජුදෙව් කාන්තාවන් ඉදිරියේ කැපී පෙනෙන බවයි
2 ඇය තමකම නසා ක්‍රියා කළ ආකාරයයි
3 නිර්භීත බව ලොවට පෙන් වූ ආකාරයයි
4 ජුදා ප්‍රතිපත්ති ප්‍රතික්ෂේප කළ බවයි

20 ජේසුස් වහන්සේගේ උපතේ විශේෂත්වය සනිටුහන් කෙරෙන සංසිද්ධීන් අතර මතෙව් සුභාරංචියේ සඳහන් ලකුණ වන්නේ

1 සඳ
2 ඉර
3 ග්‍රහලෝක
4 තාරකාව

21 රන් තුවරලා ගන්ධ රස සංඛකේතාත්මක ජේසුස් වහන්සේට පිරිනැමුවේ

1 එඬේරුන්
2 ශාස්ත්‍රවන්තයින්
3 සාමාන්‍ය ජනතාව
4 ශ්‍රාවකයින්

22 වයස් ගතව සිටි එළිසබෙත් දරුවකු ලැබීම
1 දැහැමි බවේ ද ඇදහිල්ලේ ද ප්‍රතිඵලයකි
2 කීකරුකමේ ද ඉවසීමේ ද ප්‍රතිඵලයකි
3 පරිත්‍යාගයේ ද ඉවසීමේ ද ප්‍රතිඵලයකි
4 අවංක කමේ ද විශ්වාසයේද ප්‍රතිඵලයකි

23 කිතුනු අප අපගේ කන්නලව් ඉදිරිපත් කිරීමේදී
1 බලයෙන් හා කරුණාවෙන් ඉල්ලිය යුතු වේ
2 විශ්වාසයෙන් හා ඇදහිල්ලෙන් කළ යුතු වේ
3 ලැබිය යුතුමැයි අධිෂ්ඨානයෙන් කළ යුතුවේ
4 එකිනෙකා ඉල්ලන පරිදි අප ද කළ යුතු වේ

24 සෙකරියස්ගේ ප්‍රශංසා ගීතයෙන් අවධාරණය කෙරෙන සත්‍යතාවක් වන්නේ
1 සෙකරියස්ගේ කන්නලව්වට පිළිතුරු ලද බවය
2 දෙවි සමිඳුන් ලොවට බිහි වන බවය
3 එලිසබෙත්ගේ කන්නලව්වට පිළිතුරු ලද බවය
4 දෙවි සමිඳාණෝ ජනතාවගේ විමුක්තිය සලසන බවය

25 ''ගව ඔරුවක බාවා සිටින බිළිඳකු ඔබට සම්බ වන්නේය එය ඔබට ලකුණකි'' යනුවෙන් පැවසූයේ කාහටද

1 ශාස්ත්‍රවන්තයන්ට
2 එඬේරුන්ට
3 සද්දුසිවරුන්ට
4 පරිසිවරුන්ට

26 ''ඔටු ලෝම වස්ත්‍රයක් ඇඳ ඉණ වටා පටියක් බැඳ සිටියේ ය'' මෙම ප්‍ර ප්‍රකාශය කවුරුන් පිළිබඳවද?

1 පාවුල්තුමා පිළිබඳව
2 ජේසුස් වහන්සේ පිළිබඳව
3 ස්නාවක ජොහාන් පිළිබඳව
4 පේදුරු තුමා පිළිබඳව

27 කිතු උපත දාවිත්ගේ වංශයෙන් සිදුවීම

1 දිවැස් වැකි සනාථ වීමකි
2 බලාපොරොත්තු ගෙන දෙන්නකි
3 දාවිත් රජ පෙළපත ඔසවා තැබීමකි
4 ජනතාවගේ බලා බලාපොරොත්තු ඉටු වන්නකි

28 ආගමික වත්පිළිවෙත් ඉටු කිරීමට ධර්මශාලාවල නමස්කාරයට එක්වීමට අවස්ථාව නොලද ජන කණ්ඩායමක් වන්නේ

1 පූජකවරු
2 එඬේරු
3 පරිසිවරු
4 සද්දුසිවරු

29 ජේසුස් වහන්සේගේ පිළිවෙත වූයේ

1 පාපය ප්‍රතික්ෂේප කොට පව් කරුවා පිළිගැනීම
2 පාපය හා පව්කරුවා ප්‍රතික්ෂේප කිරීම
3 පාපය හා පව් කරුවා පිළිගැනීම
4 පාපය පිළිගෙන පව් කරුවා ප්‍රතික්ෂේප කිරීම

30 දෙවියන්වහන්සේට සන්තක වීමේ බාහිර ලකුණක් ලෙස ඉටුකළ ජුදා චාරිත්‍රයක් වන්නේ

1 කැපකිරීම
2 චර්ම ඡේදනය
3 ආලේප කිරීම
4 බෞතිස්ම කිරීම

31 ජේසුස් වහන්සේ කැප කිරීම පිණිස දෙමාපියන් විසින් ඔප්පු කිරීමට රැගෙන ගියේ

1 කොබෙයියන් දෙදෙනෙකු
2 පරවියන් දෙදෙනකු
3 බැටළුවන් දෙදෙනෙකු
4 ගවයන් දෙදෙනකු

32. ජේසුස් වහන්සේගේ කැප කිරීම අවස්ථාවේ උන්වහන්සේගේ පැමිණීම බලාපොරොත්තුවෙන් දේව මාලිගාවේ රැඳී සිටියේ කවුද?

1 සීමොන් හා ආනා
2 සිමියොන් සහ අන්නා
3 එලිසබෙත් හා සෙකරියස්
4 ආබ්‍රහම් සහ සාරා

33. ''ගැලවීම මාගේ දෙනෙතින් දිටිමි'' යයි පැවසූ වදනින් ඉස්මතුවන අදහස වන්නේ

1 ගැළවීම දෙනෙතින් දුටු බවයි
2 ගැළවීම පැමිණෙන තුරු දේව මාලිගාවේ සිටිය යුතු බවයි
3 ජුදෙව් ජනතාවගේ ගැලවීම කලෙක සිට බලාපොරොත්තුවෙන් සිටි බවයි
4 සිමියොන් පමණක් ගැළවීම බලාපොරොත්තුවෙන් සිටි බවයි.

34. කිතුනු ඔබ ජීවිත පරීක්ෂාවන්ට මුහුණදීමේදී ගත හැකි වඩා යහපත් පියවර වන්නේ

1 උගතුන්ගෙන් උපදෙස් පැතීමය
2 ලෝකයේ වැඩි දෙනා ගනු ලබන පියවර අපද ගැනීමය
3 තමාට වාසි වන පරිදි විසඳුම් සෙවීමය
4 දෙව් වදන් අනුව විසඳුම් සෙවීම ය

35. අප සමාජයේ පීඩාවට පත්වන අය වෙනුවෙන් කිතුනුවාගේ වගකීම වන්නේ

1. ඔවුන් උදෙසා වැයවීමෙන් කටයුතු කිරීමය
2. ඔවුන්ට උපදෙස් ලබා දීමය
3. ඔවුන් සමාජයට හිරිහැරයක් බව ඒත්තු ගැන්වීමය
4 ඔවුන් පිනවීම සඳහා වැඩසටහන් සංවිධානය කිරීමය

36. ''ජේසුස්''යන නාමයේ අර්ථය වන්නේ

1 දෙවියන්වහන්සේ මුදන සේක	2 දෙවියන්වහන්සේ වඩින සේක
3 දෙවියන්වහන්සේ පිහිට වන සේක	4 දෙවියන්වහන්සේ අප සමගය

37. ඊශ්‍රායල් ජනතාව කුලුඳුලන් කැප කිරීම සිදුකරනු ලැබුවේ දරුවා ඉපදී

1. දින 8 කිනි	2 දින 40 කිනි	3 දින 50 කිනි	4 දින 12 කිනි

38. ජුදෙව් දරුවෙකු ටෝරාව හෙවත් ජුදෙව් ව්‍යවස්ථාව ඉගෙනීම්ට අවස්ථාව ලැබෙනුයේ

1. වයස අවුරුදු 12 සම්පූර්ණ වූ විටය
2. වයස අවුරුදු 16 සම්පූර්ණ වූ විටය
3. වයස් සීමාවක් පැවතියේ නැත
4. වයස අවුරුදු 5 සම්පූර්ණ වූ විටය

39. ජුදෙව් පාස්කුව යනු

1 ජේසුස්වහන්සේ මිනිසා පාපයෙන් මුදවා ගැනීමය
2 ඉශ්‍රායල් ජනතාව මිසරයේ වහල් බවින් මුදවා ගැනීම ය.
3. ඉශ්‍රායෙල් ජනතාව විප්‍රවාසයට ගෙනයාමය.
4. ජේසුස්වහන්සේ ස්වර්ගාරෝහණය වීමය

40 ජේසුස් වහන්සේ ප්‍රඥාමහිමයෙන් හා කාය ශක්තියෙන් ද .......................හා ............................ ප්‍රසාදය ලබමින් ද හැදුණු වැඩුණු සේක

1 දෙවියන්වහන්සේගෙන් - දේවදූතයන්ගෙන්ද
2 දෙවියන්වහන්සේගෙන් - මිනිසුන්ගෙන්ද
3 ගුරුවරුන්ගෙන් - මිනිසුන්ගෙන්ද
4 දිව්‍යසිවරුන්ගෙන් - දෙවියන්වහන්සේගෙන්ද